# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization
Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 42.ජංගම ආහාර වෙළෙන්දන්; පිළියෙළ නොකළ / සේදිය හැකි ආහාර

**හැඳින්වීම** - මෙම මාර්ගෝපදේශයන් අදාල වන්නේ ගෙයින් ගෙට ගොස් හෝ වෙළඳසැල්වල සිට ක්‍රියාත්මක වන වෙළෙන්දන් විසින් විකුණන ආහාර ද්‍රව්‍ය (උදා: මාළු, මස්, එළවළු, පලතුරු, වියළි සලාක) සඳහා පමණි.

නිශ්චිත පණිවිඩ / උපදෙස්

හිමිකරු / ක්‍රියාකරු

- සෑම විටම එක් නිශ්චිත ස්ථානයක හෝ නිශ්චිත මාර්ගයක ක්‍රියාත්මක විය යුතු අතර, ඔබ වෙළඳාම් කරන ප්‍රදේශයෙන් COVID-19 රෝගීන් හඳුනා ගැනීම හෝ COVID-19 රෝගීන් සමග සෘජු සම්බන්ධතා තිබුනේද යන්න පිළිබඳව දැනුවත්ව සිටීමට වගබලාගන්න.
- පොලිස් හා මහජන සෞඛ්‍ය නිලධාරීන් ඔවුන්ගේ ප්‍රදේශවල ක්‍රියාත්මක වන ජංගම වෙළෙන්දන්ගේ නම් ලැයිස්තුවක් තබා ගැනීම වැදගත් වේ.
- කිසි විටෙකත් ව්‍යාපාර සඳහා, හුදෙකලා කර ඇති ප්‍රදේශයකට ඇතුළු නොවන්න.
- ඔබට අසනීප බවක් දැනේ නම් ඔබ වැඩ කිරීමෙන් වැළකිය යුතු අතර ඔබගේ වෙළඳාම් කටයුතු ඔබ වෙනුවට වෙන අයෙකුට කිරීමට දීමෙන් වලකින්න.
- වෙළඳාම් කිරීමට යාමට පෙර හැකිනම් භාණ්ඩවල බර කිරා ඇසුරුම් කර තබන්න.
- පුද්ගල දුරස්ථභාවය පවත්වා ගැනීම සඳහා එක් වරකට සීමිත ගනුදෙනුකරුවන් ගණනකට සේවාව සලසන්න. වාහනයේ එක් වරකට සේවය ලබා දිය කළ හැකි ලබාදිය හැකි පරිභෝගිකින් ගණන ප්‍රදර්ශනය කරන්න.
- පහසුවෙන් මුදල ගෙවිය හැකි වන පරිදි භාණ්ඩ මිලගණන් ගනුදෙනු කිරීමට පහසු අගයකට (round figure) නියම කරන්න, එවිට මුදල් පරිහරණය අවම වනු ඇත.
- සෑම විටම මුහුණු ආවරණයක් නිසියාකාරව පළඳින්න, ඔබේ මුහුණු ආවරණය තෙත් වූ විට හෝ ඉරී ගිය අවස්ථාවකදී භාවිතා කිරීමට වාහනයේ හෝ කුටියේ අමතර මුහුණු ආවරණයක් තබා ගන්න.
- නිතරම ඇල්කොහොල් අඩංගු අත් සනීපාරක්ෂකයකින් වාහනයේ / වෙළඳාම් කරන ස්ථානයේ තබාගෙන අත් පිරිසිදු කරගන්න.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම හිමිකරුගේ වගකීම වේ.

පරිශීලක / සේවාදායකයා

- ආහාර ලබාගැනීමට සාප්පු යෑමට යාමට පවුලෙන් එක් තරුණ, සෞඛ්‍ය සම්පන්න පුද්ගලයෙකු තෝරා ගන්න.
- ඔබේම බෑගයක් / බාස්කට් එකක් රැගෙන යාමට වගබලාගන්න.
- මුහුණු ආවරණ නිසි ලෙස පැළඳ ගන්න.
- සෑම විටම අවම වශයෙන් මීටර් 1 ක පුද්ගල දුරස්තතාවයක් පවත්වා ගන්න.
- භාණ්ඩ මිලදීගැනීමේ දී අඩු කාලයක් වැයකරන්න.
- බිල්පතේ අඩංගු මුදල පමණක් ගෙවීමට හැකි වන පරිදි කාසි, මුදල් නෝට්ටු ලග තබා ගන්න.
- ඔබ ආපසු නිවසට පැමිණි විගස අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් හා වතුරෙන් අත් සෝදන්න.
- ගබඩා කිරීමට හෝ පිසීමට පෙර ආහාරය නිසි ලෙස පිරිසිදු කරන්න.
- පාවිච්චි කරන ලද මුහුණු ආවරණ වැසිය හැකි බඳුනකට ආරක්ෂිතව ඉවතලන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- ප්‍රාදේශීය සභාව මගින් අනුමැතිය ලබාදෙන අවස්තාවේ ලබාදෙන උපදෙස් පත්‍රිකාව
- සංඥා පුවරු
- දැන්වීම් /සැම වාහනයකම ( වෙළඳ කුටියකම ) පෝස්ටර ප්‍රදර්ශනය කිරීම
- සමාජ මාධ්‍ය




සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

28/06/2020